ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 ඔක්තෝබර් 27 සඳුදා
07 වෙළුම - 01 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



Photo By: TORNY NISHANTHA FERNANDO

# දහම් මලින් ලොව සරසයි
# ළමා ප්‍රදීපයට සය වසරයි

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611

ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com

වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ළදරු වියෙන් ළමා වියට පා තබන ළමා ප්‍රදීපය

( අතීතාවලෝකනයකි )

### ආදරණීය දුවේ පුතේ...

''ළමා ප්‍රදීපය'' සිය ගමන් මඟ තුළ හය වන වසර හමාර කරනවා. කලින් ''ඥානාර්ථ ප්‍රදීපය'' සමග ඔබ අතට පත් වුනු ''ළමා ප්‍රදීපය'' තනි පුවත්පතක් වශයෙන් ආරම්භ කරලා දැන් හය වෙනි වසරත් හමාර කර අවසන්. දැන් තනිව යන ගමනක හොඳ පන්නරයක් ලබා ගන්න ''ළමා ප්‍රදීපයට'' හැකියාව තිබෙනවා. එහි ප්‍රගතිය පිළිබඳව අපි මෑතකදී කළ කරුණු සමාලෝචනය හා මත විමසුම තුළදී අත් විඳින්නට හැකිවුනෙත් ඉතාම ඵලදායි ප්‍රතිඵලයක්.

ආදර දුවේ පුතේ, කතෝලික පුවත්පතක් ලෙස ළමා ප්‍රදීපය ජීවත් කරවන්නේ කතෝලික ළමා ඔබයි. එය ජීවමාන කරන්නෙත් අපගේ ළමා ලේඛක පරපුරයි. එහි හොඳ නරක, ගුණ අගුණ, විවේචනාත්මක ඇසින් බලා තීරණය කරන්නෙත් ළමා ඔබයි. මේ සියල්ල තුළින්ම ගුණාත්මක ගමනක් යෑමට ළමා ප්‍රදීපයට කදිම මඟක් දැන් විවෘත වී තිබෙනවා.

ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපයට'' හය වසර සපිරෙනවාත් සමඟම තවත් සුබ මතක් කිරීමක් ඔබට කරන්න තිබෙනවා. තවත් වසරකින් එහි මව් පුවත් පත වන ඥානාර්ථ ප්‍රදීපය සිය 150 සංවත්සරය සමරන්නට සූදානම් වෙනවා. කතෝලික මුද්‍රණාලයෙන් එළි බට ලන මේ පුවත්පත් දෙක ඇතුළුව ''messenger'' ඉංග්‍රිසි පුවත්පතත්, ඥාන ඔලී, දෙමළ පුවත්පතත් අද ශ්‍රී ලංකාවේ කතෝලික විඥානය සකසා ලන්නට මහගු මෙහෙවරක් ඉටු කොට තිබෙනවා.

හැබැයි ඒ සමස්තයේ ඉදිරි පුරෝගාමීන් බවට පත්විය යුත්තේ පාඨක ඔබ සැමයි. පාඨක හා ලේඛක ළමා ළපටීන් මෙන්ම වැඩිහිටි අප සහෝදර සහෝදරියන් දහමේ ආහාෂය ලබා පන්නරය ලබන තාක් හොඳ පරිණත මනස කින් මෙහි දයකත්වය සම්පූර්ණයෙන්ම පෝෂණය කරන බව අමතක කරන්න බැහැ.

ඉතින් ආදර දුවේ පුතේ, ඥානාර්ථ ප්‍රදීපයේ 150 වෙනි සංවත්සරයට සමගාමීව අපි දියත් කරන්නට බලාපොරොත්තු වන වැඩ සටහන් අතරට ළමා ප්‍රදීපයේ අපගේ පාඨක ලේඛක ළමා කැලටත් හොඳ වැඩදායි විධිමත් අවස්ථාවක් ලබා දෙන්නට අපි සූදානම්

ආදර දුවේ පුතේ, කතෝලික ළමා ලේඛක පර පුරක් බිහිකිරීමේ මූලික අදියරක් හැටියට මාධ්‍ය වැඩමුළු කිහිපයක් තුළින් ඉදිරියේදී ඔබව දැනුම්වත් කරලා ඔබේ වටිනා නිර්මාණ අතරින් හොඳ පොත් කිහිපයක්ම පල කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව හොඳම යොවුන් නව කථාව හා හොඳම ළමා නව කථාව රචනා කරන අප දරුවන්ව දිරිමත් කිරීමක් හැටියට ඒ පොත් මුද්‍රණය කරන්නට අත හිත දෙන අතරම වටිනා ත්‍යාගද පිරිනැමීමට බලාපොරොත්තු වෙනවා. නව කතා පමණක් නොවෙයි, හොඳම ළමා හා යොවුන් කෙටි කතා, දහම් පෑනට පිරිනමන ත්‍යාගය, හොඳම පද්‍ය නිර්මාණ ග්‍රන්ථ මෙන්ම චිත්‍ර කතා වලටත් මෙලෙසින්ම අත හිත දීමට අපි සූදානම් බව පවසන්නේ ඉතාමත් නිහතමානිවයි. මේ සියල්ල සූදානම් වන්නේ අපේ පුවත්පත්වල සංවත්සර මුල් කරගෙනයි. ඒ නිසා අපේ කතෝලික පුවත්පත්වල පාඨක , ලේඛක, පිරිසක් හැටියට ඔබ මේ සියල්ල සිත්හි නිදන්ගත කොට ඒවා ක්‍රියාත්මක කරන්නට යුහුසුළු වීම අත්‍යවශ්‍යයි.

ළමා ප්‍රදීපය දැන් විදෙස් රටවල වෙසෙන ශ්‍රී ලාංකික කතෝලික පවුල් වල දූ දරුවන් අතරත් ඉමහත් ප්‍රසිද්ධියක් දරනවා. අන්තර්ජාලය හරහා සතිපතා මේ ළමා පුවත් පත වයස් භේදයකින් තොරව කියවන බව අපට ලැබෙන ප්‍රතිචාර වලින් මනාව පැහැදිලියි.

ආදර දුවේ, පුතේ, ''ළමා ප්‍රදීපය මහත් අභිමාන යෙන් සිය හයවෙනි සංවත්සරය සමරන කොට මේ සියල්ල මතක් කොට ඔබව දිරිමත් කරන්නට අපි බලාපොරොත්තු වුනේ ඒ නිසයි. ඉතින් ළමා ප්‍රදීපය දැන් ළදරු වියෙන් ළමා වියට එළඹිලා එහි සිට සිය යොවුන් විය වැළඳ ගන්නට ආදර යෙන් බලා සිටින නිසා එය වටා රොඳ බැඳ ගන්නා ආදරණීය දරු කැලක් හැටියට ඔබත් ශක්තිමත් වී අපවත් ශක්තිමත් කරන්න කියා ඉතා නිහතමානීව ආදරයෙන් ඉල්ලා සිටිනවා.

**"ළමා ප්‍රදීපය" සැමද දිනේවා !**

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ආධ්‍යාත්මික භෝජනය



මනුෂ්‍යයෙකු තුළ ස්වභාවික මෙන්ම අධ්‍යාත්මික වශයෙන් ශරීර දෙකක් පවතී. එය කතෝලිකයන් වන අප අවබෝධ කරගත යුතු කාරණාවකි. එම සොබාවික හා ආධ්‍යාත්මික ශරීරය වර්ධනය කිරීම සඳහා එය පෝෂණය කළ යුතු වේ. ඒ අනුව ස්වභාවික ශරීරය වර්ධනය සඳහා විවිධ පෝෂ්‍යදායි ආහාර අප විසින් ලබා ගන්නෙමු. එම ආහාර මුඛයෙන් ඇතුලු වී විවිධ පෝෂ්‍යදායි කොටස් ශරීර අභ්‍යන්තරයට උරා ගෙන. ඉතිරිය ආමාශගත වීමෙන් පසුව ශරීරයෙන් බැහැරවේ. මෙය සාමානයෙන් මනුෂ්‍යයෙකු තුළ සිදු වන සිද්ධිදාමයකි.

එහෙත් ආධ්‍යාත්මික ශරීරය වර්ධනය සඳහා අප කළ යුත්තේ කුමක්ද? ධර්මයට ඇළුම් වී ඒ අනුව ජීවත් වෙමින් යහපත් ක්‍රියා හා යහපත් සිතුවිලි, ඇති කර ගැනීම තුළින් යම්තාක් දුරට ආධ්‍යාත්මික ශරීරය, පෝෂණය කරගත හැකිය. එහෙත් එය අප අධ්‍යාත්මික ශරීරය වර්ධනය සඳහා පෝෂණය ලබාගන්නා සේ මුඛයෙන් ශරීර අභ්‍යන්තරයට ඇතුළත් කර නොගනී. එහෙත් ආධ්‍යාත්මික ශරීර වර්ධනයට අපි විසින් මුඛයෙන් ආහාරයක් හා පානයක් ලබා ගන්නෙමු. එය නම් ශුද්ධ වූ පූජය හා මිදියුෂයය.

මෙය අනුභව කළවිට අනෙකුත් ආහාර මෙන් ආමාශගත නොවේ. එය මනුෂ්‍ය හදවත් තුළට ඇතුලත් වේ. මෙය ආධ්‍යාත්මික ශරීර වර්ධනය සඳහා මුඛයෙන් ලබා ගන්නා වූ ලොව ඇති එකම ආහාරය හා පානයකි. එය ශුද්ධවූ පානයක් හා ආහාරයකි. එය අනුභව කිරීම තුළින් ආධ්‍යාත්මික ශරීරය නිසිලෙස වර්ධනය කර ගත හැක්කේ සීමිත පිරිසකට ය. එනම් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ව හදවතින් පිළිගෙන උන්වහන්සේව විශ්වාස කරන්නා වූ අනුගමනය කරන්නාවූ කිතුනුවන්ට පමණි.

**හිමාලා ප්‍රනාන්දු**
**සා. ඇලෝසියස් දහම් පාසල (ආචාර්ය මඩුල්ල)**
**රඹුක්කන**

# අප ආදර මරි මවුන්



පුංචි නංගියේ මල්ලියේ අපි සැම දන්නවා මරි මවුන් අපගේ දේව අම්මා ලෙස අපට ආදරය කරන බව. ජනවන්දනාව තුළ මරිය තුමියට හිමි වන්නේ ඉතා සුවිශේෂී ස්ථානයකි. පුංචි ඔයාලා දන්නවා ජේසු කුමරුගේ මව වූ මරියතුමී කතෝලික භක්ති අභ්‍යාසයන්හි අති විශේෂ තැනක් ලබන බව ඉතින් ආදර නංගියේ, මල්ලියේ, අපේ දෙව් මවුන් හට වාර්ෂිකවද චක්‍රා කාරවද, ශුද්ධ වූ සභාව විසින් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාභිරහස්‍යයන් උත්සවාකාරයෙන් අනුස්මරණය කරද්දී. දේව මාතාවන් වූ පරිශුද්ධ කන්‍යාමරියාවන්හට විශේෂාකාරයකින් ගරු බුහුමන් දක්වන්නේ සිය පුතුනුවන් සිදු කළ ගැලවීමේ ක්‍රියාවට ඈ වෙන් කළ නොහැකි ආකාරයකින් සම්බන්ධ වූ බැවිනි.

ක්‍රිස්තු ජීවිතයේ හා සභා ජීවිතයේ කේන්ද්‍රස්ථානයන්හි මරියාවන් හට කතෝලික බැතිමතුන් තුළ ඉතා සමීප වූද වෙසෙසින් ගැඹුරුවූද සබැඳියාවක් සහිත ආධ්‍යාත්මික ජීවිතයක් ගොඩනගා ඇත. ලොව පුරා අපගේ දේව මාතාවන්ට කැප කරන ලද දේවස්ථාව සංඛ්‍යාව අන් කිසිම මුනිවරයෙකුට හෝ මුනිවරියකට හෝ නොමැති තරම්ය. බොහෝ තාපස තාපසිකාවන්ගේ හා පූජකවරුන්ගේ නිකායන් පමණක් නොව ඇතැම් ගිහි සංවිධාන පවා මරියාවන් තම කුටුම්භයන්හි අරක්ගත් තැනැත්තිය වශයෙන් සලකති. ලොව ඇතැම් රටවල් පවා මරිය වහන්සේගේ නමට කැප කර තිබේ. කතෝලික ''දහම් ගායනා'' වලදී අති ජනප්‍රිය වන්නේ මරි මවුන් මැයෙන් සැකසුණු ගීතිකාවන්ය. ''ස්වාමිවාක් ආරාධනාව'' හෙවත් පරමණ්ඩල යාච්ඤාවට දෙවැනුව ලක්ෂ සංඛ්‍යාත කිතුනු ජනයන්ගේ මුවින් හා සිතින් කීමෙන යැදුම නම් ''නමෝ මරිය'' හෙවත් ජපමාලයයි. ජපමාලය නිතර උච්චාරණය කරමින් ළමා අපිත් දේව අම්මාට අපගේ ආදරය පුද කරමු.

**ඩිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**
**13 ශ්‍රේණිය**
**සා. පියෝ කනිටු දෙව්සත්හල - පල්ලන්සේන**

# ළමා ප්‍රදීපයට දෙගුරුන්ගෙන් සුබ පැතුම්

ළමා ප්‍රදීපයේ 6 වන සංවත්සරයට ශුභ පතමි. පසුගිය වසරේ සිට මේ දක්වා නොකඩවාම අප දහම් පාසලේ සියළුම දරුවන් ළමා ප්‍රදීපය කියවීම විශේෂත්වයකි. එසේම හා හා පුරා කියමින් තම නිර්මාණ පුවත්පතකට යොමු කර ප්‍රහේලිකා වැනි තරඟ වලින් ජය ලැබීමද වැල්ලවාය වැනි දුෂ්කර පළාතක් ලද විශාල ජයග්‍රහණයක් ලෙස මම දකිමි.

දරුවන්ගේ නිර්මාණ දුටු සමහර වැඩිහිටියන් මුදලින් හා භාණ්ඩ වලින් පවා ඔවුනට උදව් උපකාර කිරීමද කෘතවේදිව සඳහන් කරමි. විශාල ප්‍රමාණයක් වූ අනේක විධ පුවත්පත් අතර පුංචි ළමා ප්‍රදීපය, දහම වෙනුවෙන් කරනා සුවිශේෂි මෙහෙවර විශිෂ්ට ලෙස ඉදිරියට යමින් තව තවත් දියුණු වන්නට දේව වරම් පතමි.

**ප්‍රියංගනී පෙරේරා**
**( ප්‍රධාන ආචාරිනී)**
**ශා. මරියා දහම් පාසල - වැල්ලවාය**

නිල් අහසට පෑයු රන් තරුවක් වැන්නේ
ආසියාවේ එකම ළමා ප්‍රදීපය වන්නේ
ළමෝ ළපටි ඉරිදෙ තෙක් බලා සිටින්නේ
ළමා ප්‍රදීපය ගන්නට දුවගෙන එන්නේ

ලේඛක ලේඛිකාවෝ රැසක් බිහි වී ඉන්නේ
චිත්‍ර අඳින්නට සැම දෙන පෙරමුණ ගන්නේ
ළමා දැනුම වැඩි කරන්න උත්සුක වන්නේ
වසර හයක ඔබේ අගය පහදා දෙන්නේ

දරුවන්ගේ හැකියාවන් ලොවට බෙදන්න
කිතුනු උරුමයන් අපහට පෙන්වා දෙන්න
චිත්‍ර පිටුව පුංචි අයට චිත්‍ර අඳින්න
හැමදෙමත් මේ විදිහට ඉඩකඩ දෙන්න

බාල මහළු තරුණ සැමට ළමා ප්‍රදීපේ
මේ සැමටම දැනුම දුන්න ළමා ප්‍රදීපේ
වසර හයක් සමරන මේ ළමා ප්‍රදීපේ
''හැපි බර්ත්ඩේ ටූ යූ'' ළමා ප්‍රදීපේ

**සන්ධ්‍යා කුමාරි - (දහම්ගුරු මණ්ඩලය)**
**පාතිමා මාතා දහම් පාසල**
**යායමුල්ල - (වල්පිටගම මීසම)**

සුපිපෙන කැකුළු මල් වල දස්කම් නිතින
හඬගා කියන්නට ලොවටම වෙර දරන
ප්‍රඥා කිරෙන් දරුවන් නිති සවි වඩන
දරු පරපුරට මව් උණුහුම් ඔබ නිතින

"ළමා ප්‍රදීපය" කිව්වත් ඔබ මවකි
හරි මඟ පෙන්වනා රැකවල් සුරදුවකි
දැනුමෙන් දරු කැළව පුරවන ගුරුමවකි
වත්මන් අපට ඔබ දෙවිඳුගෙ තිළිණයකි

තබනා තබන පියවරයන් දිරිය දරා
මුමුණා මුමුණනා විට තම දෙතොල් පුරා
ගයනා ගයන ගුණ ගී මල් වැල් දහරා
වැජඹෙන්නටයි ආසිරි ලෝ තිබෙන තුරා

**ඈන් සුරංගි - (ආචාර්ය මණ්ඩලය)**
**ලොයොලා විදුහල - බෝපිටිය**

පුංචි හුරුබුහුටි පුවත් පතක්, ඉතාමත් සහන මිලකට, එහෙත් මිල කළ නොහැකි අගනා ලිපි, නිර්මාණ, කතන්දර පලවන, ළමා මනසට මෙන්ම වැඩිහිටි අයටත්, දහම් ගුරු භවතුන්ටත්, එකලෙස වටිනා යමක් තිළිණ කරන හයවැනි සංවත්සරය සමරන ළමා ප්‍රදීපයට මාගේ අවංකවූ ප්‍රණාමය පුද කරමි. ළමා ප්‍රදීපය දිගුකල් දිනේවා !

සංස්කාරක ගරු ශාන්ත සාගර පියතුමාටත්, සහය සංස්කාරක කුමර නයනජිත් මහත්මාටත්, ළමා ප්‍රදීපය අප දෑතට පත් කිරීමට වෙහෙසෙන සහෝදර සහෝදරියන්ටත් දෙවියන් වහන්සේ තුළ මේ මිල කළ නොහැකි සේවාව අපට ලබාදීමට කැපවන සියළුම දෙනාට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය, සුවය, දීර්ඝායුෂ ලැබේවා!

**නෙල්කා ශ්‍යාමලී ( දහම් ගුරු )**
**කාර්මෙල් මාතා දහම් පාසල - වැල්ල පල්ලිය**



මග්ගොන සාන්ත මරියා දහම් පාසලේ දරු දැරියෝ 37 ක් පසුගියදා ප්‍රථම වරට දිව බොදුන් ලබා ගත්හ. මීසම් සේවක, ගරු ඉෂාන් ප්‍රමීන පියතුමා, ගරු මේරි ලියෝනිල්ඩා, ගරු මේරි දුතිකා පැවිදි සොහොයුරියන්, දහම් ගුරුවරිය සමඟ ළමුන් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



වාද්දුව මීසමේ ළමෝ 49 ක් පසුගියදා ශුද්ධාත්මයාණන්ගේ දෙව් මැදුරේදී ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දිව බොදුන් ලැබූ ළමුන් වාද්දුව මීසම් සේවක ගරු. ජූඩ් සුරාජ් ෆොන්සේකා, ගරු ලූෂන් පෙරේරා (නි.ම.නි.) පියතුමන්ලා, ගරු හෙන්රිටා සහ ගරු උර්සුලා පැවිදි සොහොයුරියන් සමග ගුරු භවතුන් වන මිල්රඩ් ප්‍රනාන්දු මෙනෙවිය හා දේශාන් පෙරේරා මහතාද සමග සමූහ සේයාරුවකට පෙනීසිටි අයුරු.

**කොන්රඩ් සිල්වා**

# 125 වන දෙසුම ගොඩැල්ලේදී.......



ගොඩැල්ල මීසමේ සුදතුම් වරම් ලැබීමට සුදනම් වන දු පුතුන් සඳහා විශේෂිත දෙසුමක් පසුගියදා ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව් මැදුරේදී පැවැත්වුණි. මේ සඳහා ගොඩැල්ල, තඹරවිල, දංකොටුව හා මෝරුක්කුලිය දේවස්ථානයන්හි ළමෝ එක්වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. දේශක මහතා මෙහෙයවූ 125 වන වැඩසටහන මෙයවීම විශේෂත්වයකි. ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩසන් පියතුමාගේ අදහසකට අනුව පැවැත්වූ මෙයට මීසම් සහයක ගරු නුවන් එමල්ක පියතුමා හා ළමුන් භාර ගුරුභවතුන්ද සහයෝගය ලබාදුනි. **ඒ. සිරිල් පෙරේරා**

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සිව්වන තේමාව :- ක්‍රිස්තියානි යාච්ඤාව

### 4.3.2 ස්වාමිවාක් ආරාධනාව

21. ''මුළු මිනිස් සංහතියම එකම දරු කැලකි. මෙම සහෝදරත්වයේ බැඳීම පිළිගෙන ජීවත් වීමට ඇරයුම් කරන යාච්ඤාව වනුයේ,........ (2008/22)

22. ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගත වී ඇති යාච්ඤාව නම්,..... (2010/39)

23. ස්වාමිවාක් ආරාධනාවේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයක් නම් කර, එයින් ලැබෙන පණිවිඩ දෙකක් ලියන්න. (2008/04.2)

24. රටේ සාමය උදෙසා යාච්ඤාවක් වචන 50 කින් පමණ ලියන්න. එම යාච්ඤාව ස්වාමිවාක් ආරාධනාවේ දැකිය හැකි සුලක්ෂණ පහ අනුව ගොඩනැගිය යුතු වේ. (2008/04.3)

25. ස්වාමිවාක් ආරාධනාවේ සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න.(2006/05.1)

26. ස්වර්ගයේ වැඩසිටින යාච්ඤාව උච්චාරණය කරන විට දෑත් ඔසවන්නේ මන්ද? (2012/34)

### 4.3.3 උත්තම පූජක යාච්ඤා

27. උත්තම පූජක යාච්ඤාව ක්‍රිස්තුන් වහන්සේ.... (2010/35)

28. ජුවාම් 17 පරිච්ඡේදයේ සඳහන් උත්තම පූජක යාච්ඤාවේ මූලික ලක්ෂණ තුනක් ලියන්න. (2009/05.2)

29. උත්තම පූජක යාච්ඤාව ....... (2012/36)

### 4.3.4 ස්වාමිවාක් ආරාධනාව හා උත්තම පූජක යාච්ඤා පිළිබඳ සැසඳීමක්

### 4.3.5 යාච්ඤාව සහ නව ගිවිසුමේ වෙනත් චරිත

30. දේව කැමැත්තට අවනත වූ මරියතුමිය ගාබ්‍රියෙල් දේව දූතයාට දුන් පිළිතුර කුමක්ද? (2008/04.1)

31. ලුක් සුවිශේෂයේ සඳහන් ප්‍රශංසා ගීත (උදාන ගී) දෙකක් ලියන්න. (2010/01.6)

### 4.4 යාච්ඤාව සහ මුල් කිතුනු සභාව

32. ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහිද, රොටිකැඩීමෙහි ද ,........... නිරතව කල් ගත කළහ. ඉහත හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ, (2008/24), (2011/33)

33. බර්ණබස් සහ සාවුල් ධර්මදූත සේවාවට පිටත් කීමට පෙර අපෝස්තුළුවරුන් කුමක් කළේද? කරුණු දෙකක් ලියන්න. (2009/01.10)

34. ශුද්ධවූ පාවුලුතුමා රෝමවරුන්ට ලියූ ලිපියට අනුව වචනවලින් කිව නොහැකි සුසුම්ලෑම්වලදී දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයදින්නේ කවුරුන්ද? (2011/38)

35. ශුද්ධවූ පාවුලුතුමා යාච්ඤාව හඳුන්වාදී ඇත්තේ,....... (2012/32)

### 4.5 යාච්ඤාව සහ ශුද්ධවන්ත ජීවිතය

36. අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමාගේ යැදුමක් වූයේ,.... (2008/21)

37. ''ස්වාමිනී මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව.'' මෙසේ යාච්ඤා කලේ, ....(2011/39)

38. ''යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත් වීමට නොදනී''. මෙසේ පවසන ලද්දේ,.....(2010/31)

### 4.6 යාච්ඤාව වර්තමාන සමාජයට

39. නිරන්තර යාච්ඤාවේ වැදගත්කම පෙන්වා දුන් ක්‍රිස්තු ඉගැන්වීම් අනුව යාච්ඤාව ඔබගේ දෛනික ජීවිත අංගයක් කරගන්නා අයුරු කරුණු පහකින් පෙන්වා දෙන්න.(2009/05.3)

40. ඔබගේ විභාගයේ ප්‍රතිඵල ලැබුණු පසු ඔබ දෙවි පියාණන්ට කරන ස්තුති කිරීමේ යාච්ඤාවක් වචන 50 කින් පමණ ලියන්න. (2011/06.3)

### භාවනාව

41. භාවනා කිරීමේදී අත්‍යවශ්‍ය සාධකය කුමක්ද? (2009/01.9)

42. භාවනාවේ පළමු පියවර සහ දෙවන පියවර ලියා දක්වන්න (2011/01.10)

43. ''ඔබේ ජීවිතයේ අයිතිය ජේසු සමිඳුන්ට දෙන්න.'' භාවනාත් මක ජීවිතයේ තුන්වන පියවර වන ඉහත උපුටනයෙන් පැහැදිලි වන්නේ,........ (2012/37)

44. අපගේ ජීවිතයේ අයිතිය දෙවිඳුන්ට බාර දෙන විට අපි උන්වහන්සේට ,.... (2012/39)

**අනුමාන හා ආදර්ශ ප්‍රශ්න ලබන සතියේ**

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

## නර්තනයෙන් ජයලැබූ සිඟිති කුමරියෝ



කොළඹ අගරදගුරු පදවියේ පෙර පාසල් නගා සිටුවීමේ අරමුණ ඇතිව අගරදගුරු පදවි කතෝලික අධ්‍යාපන කොමිසමේ පෙර පාසල් අනුකමිටුව සංවිධානය කරන ලද ''දෙව්ඳු තිළිණ'' ප්‍රසංගය පසුගියදා ග්‍රෑන්ඩ්පාස් සා. ජෝසප් විදුහලේදී පැවැත් වුණි. මෙහිදි නර්තන අංශයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට පානදුර යහපත් එඩේරා කනනරාමය පෙර පාසල සමත්වුණි. ජයග්‍රාහී ළමුන් ආචාර්ය මඩුල්ල හා අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු රංජිත් මදුරාවල පියතුමා සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **කුමර**

## හලාවත පදවියේ වැඩසටහන් 50 ක් සපුරයි.



අගුණවිල මීසමට අයත් දහම් ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා බත්තුළුඔය රජයේ විදුහලේදී පැවැත්වුණි. මේ සඳහා අගුණවිල වන්නි මඩු, බත්තුළුඔය ශා. අන්තෝනි, විල්පොත ශු. පුඩ් , විජයකටුපත සඳසරණ , ගල්කුලිය ක්‍රිස්තු රාජ, තාර්විල්ලුව ශා. සෙබස්තියන් දහම් පාසල් හි ළමෝ එක්වුහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. වැඩමුළු 125 ක් මෙහෙයවා ඇති දේශක මහතා මෙම ළමා ලේඛක වැඩමුළුව හලාවත පදවියේ පමණක් මෙහෙය වූ 50 වන වැඩමුළුව වීම ද විශේෂත්වයකි. අගුණවිල මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමන් විසින් ආචාර්ය මඩුල්ලේ සහයෝගයද සමගින් මෙය උත්කර්ෂවත් ලෙසින් සංවිධානය කෙරෙනි. **පීටර් කැමිලස් සුබසිංහ**

## පුංචි ඔබත් වැඩිහිටි අපිත් ළමා ප්‍රදීපය ඉදිරියට රැගෙන යමු.

ආදර දරුවෙනි සිය 06 වෙනි උපන් දිනය සමරන ළමා ප්‍රදීපය පුවත් පත විවිධ පැති කඩ ඔස්සේ, අප සැමටම දැනුම ලබා දී තිබේ. විශේෂයෙන් අප රටේ මෙන්ම ලෝකයේ සිදුවන සහාවේ තොරතුරු අපට දැන ගැනිමේ හැකියාව මෙම පුවත් පත මගින් අපිට උදව් තිබේ. එසේම ළමා ප්‍රදීපයේ සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මීසම් හා පදවි මට්ටමින් ළමුන්ව ලේඛන වැඩමුළු තුළින් දැනුම්වත් කිරීම මඟින් ආධුනික නිර්මාණ කරුවන්ට තම නිර්මාණ ඉදිරිපත් කිරීමට හා තම හැකියාවන් ඔප්නන්වාලීමට හැකිවීම විශේෂත්වයකි.

ආදර දරුවෙනි, ප්‍රහේලිකා, සාන්තුවර චරිත මගින් සතිපතා ඔබගේ දැනුම වැඩිවන බව පැහැදිලියි එසේම මීසම් , දිසා හා පදවි මට්ටමින් සිදුකරන විවිධ ක්‍රියාකාරකම් පුවෘත්ති වශයෙන් ළමා ප්‍රදීපයේ පල වීම මගින් අපිත් ඒ පිළිබඳව දැනුම්වත් වෙනවා. ආදර දරුවෙනි, ළමා ප්‍රදීපය මෙම සය අවුරුද්දක තුල සිදු කල මෙම කාර්යය තව වසර ගනනක් ගෙනයන්න ඔබ , මාගේ සහය ලබා දිය යුතු වේ. ළමා ඔබත් වැඩිහිටි අපිත් සතිපතා ළමා ප්‍රදීපය මිලදී ගෙන මෙහි වටිනාකම් අනිත් අයට පවසා ඔවුන්ව උනන්දු කිරීම අපගේ යුතුකමකි. ළමා ප්‍රදීපයට දේව ආශිර්වාද ප්‍රාර්ථනා කරන අතර වසර 06 ක් සපුරන ගමන් මගට සුබ පතමි.

**අසික ප්‍රියදර්ශන (ආචාර්ය මඩුල්ල)**
ශා. මරියා දහම් පාසල - කටුකරුන්ද මොරටුව

## වසර හයක අමිල මෙහෙවර

ප්‍රථම ව ළමා ප්‍රදීපය වෙත මාගේ උණුසුම් ශුභ පැතුම් ප්‍රර්ථනා කොට සිටිමි. 2008 වසරේ එනම් ඥානාර්ථ ප්‍රදීපයෙන් වෙන් වී ''ළමා ප්‍රදීපය'' ලෙස එළිදැක්වූ ද පටන් පාඨකයෙක්, ලේඛකයෙක් ලෙස මා ළමා ප්‍රදීපයෙන් ලද දැනුම අති මහත්ය. ජාතික ළමා පුවත්පතකට නොදෙවෙනි වන ලෙස සතිපතා පළවන ළමා ප්‍රදීපය ගැන බොහෝ දෙනා කතා කරන්නේ ප්‍රශංසනීය මුවෙනි. කුඩා දරුවා පටන් යොවුන් වියේ සිටින දරුවන් දක්වාද, ඇතැම් විට වැඩිහිටියන් දක්වා වූ පුළුල් පරාසය තුළ ඒ සියල්ලන්ට අවශ්‍ය, උචිත දෑ ගෙන හැර පෑමට ළමා ප්‍රදීපය සමත් වී සිටියි. පුවත් පතකට එහා යමින් ළමා වැඩමුළු, ප්‍රහේලිකා තරඟ, ආදිය තුළින් ළමා ප්‍රදීපය සිදු කරන නොනවතින මෙහෙවර අති විශිෂ්ටය.

**වියානි පියුමන්ත**

**ළමා ප්‍රදීපය 06 වන උපන් දිනයට සුභ පැතුම් පත් එවූ, සංවත්සර කලාපයට නිර්මාණ යොමු කළ ආදර දූ පුතුන්ට ස්තූතියි.**

## පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයයි !

දිනෙන් දින වර්ණවත් වන, මොහොතින් මොහොත ජන සිත තුළ ලැගුම් ගන්න, සැම දනව්වකම ළමා සිත් කියවන අපේ පුංචි පත්තරේ ළමා ප්‍රදීපයයි. පුංචි අපේ පුංචි හැඟුම් ළමා ලෝකයටම පතුරවන්නේ, පුංචි අපේ පුංචි උපදෙස් වැඩිහිටියන්ට පවා බෙදාහරින්නේ ලේඛන කලාවට හැකියාවක් දක්වන ඔබට, මට අතහිත දෙන පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයයි. පුංචි අපේ සිත්වලට නැගෙන අදහස් බොහෝමයි. පුංචි කමට ඒ සිතුවම් කඩදාසියක ලියා නැතිනම් කඩදාසියකට වර්ණ ගන්වා වැඩිහිටි සිත් පවා මවිත කරවන්නට පුංචි අපට රුකුලක් වූයේ පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයයි. සාගර තරංගයේ හැපි හැපී යන නෞකාවට ආලෝකය ලබාදෙන ප්‍රදීපාගාරයක් ලෙස පුංචි අපේ හිත්වල මතුවන අදහස් තෙලි තුඩට ගන්වා අප සතු හැකියා ඔපනංවා ගන්නට අපට අත දෙන්නේ, අපේ පුංචි ලෝකය එකළු කරන්නේ පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයයි.

පුංචි අපට දහම් දැනුම කියාදී , ජේසුස් වහන්සේ ගැන, මරිය අම්මා ගැන, දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් පුංචි අපේ සිත් තුළ ඇතිකරගන්න, අපට විවිධ ජයග්‍රහණයන් ලබා ගන්න අපට උදව් වුණේ පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයයි. වසර 6 ක් පුරාවට ළමා ප්‍රදීපය හා එක්වී සිටි මා අද ළමා ප්‍රදීපය තුළින් ලබාගත් දැනුම් සම්භාරය වචනයකින් පවසා නිම කිරීමට නොහැකි තරම්. කුඩා කල පටන් ලිපි මගින් සිතුවම් මගින්, නිසදැස් මගින් ළමා ප්‍රදීපය හා සම්බන්ධ වූ මා අද ලේඛිකාවක් බවට පත් වී ඇත්තේ ළමා ප්‍රදීපයේ ඉමහත් උපකාරය නිසාය. අද මාගේ නිර්මාණ වෙනත් පුවත්පත් වල පළ වන්නේද මෙයින් ලබාගත් අත්දැකීම් නිසාවෙනි.

ආසියාව පුරාවටම ඇති එකම කතෝලික ළමා පුවත්පත වන පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපය සමරන හයවන උපන්දිනයට මාගේ මුළු හදවතින්ම සුබ පතන්නේ ඉතාමත් සෙනෙහෙබර ළෙංගතුකමකිනි. අද වන විට පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපයට මෙවැනි වූ සාර්ථක ගමනක් පැමිණීමට හැකි වූයේ මහා වෘක්ෂයක් මෙන් සිටින අති දැවැන්ත සංස්කාර මඩුල්ල නිසා බව අපි කව්රුත් දන්නා කරුණකි. සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා හා සහය සංස්කාරක වන කුමර නයනජිත් මහතා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටම ඉතාමත් ගෞරවයෙන් ස්තුතිය පුද කරන අතර තව තවත් පුංචි අපේ පත්තරේ ළමා ප්‍රදීපය, වර්ණවත් කරන්නට අවශ්‍ය දේව ශක්තියද ප්‍රාර්ථනා කරමි.

**කේ.ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
**13 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**

## දිගුකල් වැජඹේවා !

*සති අන්තයන් සමගම අප හා* — එක්වන්නේ
*කවි සිත්තම් හා නව දැනුමත්* — සමඟින්නේ
*සුදුවර චරිතයක් වූ වතගොත* — පවසමින්නේ
*මෙලෙසම සැමකල් ඔබ ඉදිරියටම* — යන්නේ

*පහන් සිතුවිලි සමගම අප* — සනසන්නේ
*අවවාදයෙන් අප සැම නිසි මඟ* — ගෙනයන්නේ
*අපගේ දස්කම් ඔබ සැමදින* — අගයන්නේ
*ළමා ප්‍රදීපය ඔබ දිගු කල්* — වැජඹෙන්නේ

**හිරුණි රංසිකා මල්ෂාණී**
**10 ශ්‍රේණිය**
**ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ**




**මලීෂා කාවින්දි**
04 ශ්‍රේණිය
**සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය පයාගල**

## ශුභාසිරි ......

සිරිලක් කිතු සසුනට
නැණරුත් පහන් දල්වා
ළමා දිවියට දැනුම දෙමින්
ලැබුණු වටිනා තෑග්ගක්.....
සය වසරක් ගෙවේ ......
අප සැමට දැනුම ලැබේ......
ළමා සිත් සැනසේ
දිනෙන් දින පිබිදේ.......
ළමා ප්‍රදීපයෙනි,
පරපුරකට ආලෝකයක් වී....
කිතු සසුන බබලවන්න.




**චමත් ඉමාෂ කුරේ**
**හබරණ**

# ආදරණීය ළමා ප්‍රදීපයට සුබ උපන් දිනයක් වේවා !

කවි ලියන්නට පද වැල් එකට අමුණන්නට
මා හදෙහි හට ගත් හැම කැටි කරන්න
අවසර දුන් මා දැතෙහි රැඳි පෑනට
පළ කරන්නට කැප කළ ඔබේ පිටුවට
මා දයාබර ''ළමා ප්‍රදීපය '' ඔබට තුති

හඬගා කියන්නට ඇති හැම දෙවිඳුන්ට
හඬගා කියන්නට ඇති හැම මව්පියන්ට
හඬගා කියන්නට ඇති හැම හිතවතුන්ට
ඒ හැම දෙය වෙනුවෙන්ම මැදිහත් වූ ඔබට
මා දයාබර ''ළමා ප්‍රදීපය '' ඔබට තුති

මා සහෝදර සහෝදරියන්ට දිරියක් වන්නට
සැම හදවත් රැගෙන ඉදිරියටම යන්නට
තව වසර ගණනාවක් අප හැම හා රැඳෙන්නට
දිනෙන් දින ඉදිරියටම පා ඔසවන්නට
මා දයාබර ''ළමා ප්‍රදීපය '' ඔබට තුති

**නිපුන් නවෝද**
**10 ශ්‍රේණිය**
**ශු. ආනා දහම් පාසල - සරික්කාලිමුල්ල (පානදුර මීසම)**



මිනිස්කම තුරන් වූ සමාජයක
හැදී වැඩෙනා දරුවන් හට
කිතු දහම කියා දෙමින්
ලේඛන කුසලතා ඔප්නංවන
6 වන සංවත්සරය සමරන
එක ම කිතුනු ළමා පුවත්පත වන
ළමා ප්‍රදීපයට මාගේ හද පිරි
සුබ පැතුම් ද එක් කරමි.

**ඈන් පියුමි සපරමාදු**
**08 ශ්‍රේණිය**
**ලොයොලා විදුහල - බෝපිටිය**

දහම් ගුණය උතුරා යයි
පුංචි අපේ සිත් පින වයි
හෙට පිපෙනා මල් යා යයි
ළමා ප්‍රදීපයට හය වස රයි

**වත්සලා නිර්මාණි**
**10 ශ්‍රේණිය**
**ශා. මරියා දහම් පාසල - වැල්ලවාය**

**පුංචි අපේ අතින් ලියැවෙන කවි, කෙටිකතා, චිත්‍ර , රචනා මේ හැම දෙයක්ම එළිදකින්නේ පුංචි අපේ "ළමා ප්‍රදීපය" නිසයි. හැම විටම ඔබ අපට ආශිර්වාදයකි. ඔබට සුබ උපන්දිනක් වේවා.!**

**හිමංසලා මල්ෂානි**
**04 ශ්‍රේණිය**
**සිරිහද දහම් පාසල - බොල්ලත**

අපේ නිර්මාණ වලට හැම මොහොතෙම ඉඩ ලබාදෙමින් අපව දිරිමත් කරන අපේ ළමා ප්‍රදීපයේ 06 වන උපන් දිනයට අපෙන් ශුභ පැතුම්

**සංදීප මල්ෂාන්**
**08 ශ්‍රේණිය**
**ක්‍රිස්තුරාජ ජාතික පාසල - තුඩැල්ල**



# Unknown Catholic Saints

## St Louis

### *Feast Day - (August 25)*



**St Louis, painted by EI Greco**

The only canonised king of France, Louis IX succeeded to the throne aged 12 after his father Louis VIII died, his mother Blanche of Castile assuming the rale of regent.

The king is chiefly remembered for his crusading, taking part in the Seventh Crusade (1248) in his mid-30s and then again joining the Eighth Crusade while in his 50s. The first of these began well but ended in predictably disastrous fashion.

Although Jerusalem had fallen to the Muslims in 1245, this caused less of a shock in Christendom than with previous conquests, the city having changed hands now so many times as to be less than earth-shattering. Nevertheless France, having ended the Albigensian Crusade against Cathar heretics in the Langue-doc, had resources, and in 1245 Louis, almost alone among Europe's apathetic leaders, set sail to win back the Holy Land. By late 1249, however, his army had been bogged down by the Nile, and the following year Louis was captured by the Egyptians and ransomed for 400,000 livres, a third of the kingdom's annual revenue. After this he spent four years in Acre, Jaffa and elsewhere in the Crusader kingdoms, leaving not just a formidable Christian defence but a Francophone legacy that is still felt among the Maronites of Lebanon (cemented by the mandate of the 20th century).

Away from warfare he did much to promote the Gothic style of art and architecture that marks the triumph of medieval Europe, spreading Parisian artistic styles across the continent. Among his greatest legacies is La Sainte-Chapelle on the Isle de la Cite in Paris.

France was Europe's pre-eminent state during this period and for this reason it is often called the "golden century of Saint Louis". According to one contemporary, "The prestige and respect felt in Europe for King Louis IX were due more to the attraction that his benevolent personality created rather than to military domination" -although that certainly helped.

Famous for his sense of justice, he clamped down on nobles, including the Lord of Coucy who in 1256 was brought to trial for killing three young men, was refused trial by battle and forced to pay money for the Masses of the men he killed. Louis also made peace with the Count of Barcelona, thus helping to confirm the Spanish-French border as it remains today.

But his holiness went hand-in-hand with a zeal that today we find unpleasant. He cracked down on "usury", by which was meant extorting money from the Jews (and Lombards), and he also expanded the power of the Inquisition against the Cathars, leading to an atmosphere of terror and suspicion in the south.

Zealous for the faith, in 1267 he, along with three sons, took the cross once more, and landed in Carthage, where disease broke out across the camp, taking the king away.

# මාංශගතවීමේ අභිරහස සහ භාග්‍යවන්ත දේව මාතා වහන්සේ.

**පසුගිය සතියෙන් .....**

<u>දේව දූතයාගේ පණිවිඩය</u>

මේ අවස්ථාවේදී මරිය වහන්සේට මේ දේවල් සිදුවන ආකාරය දැනගැනීමට බලවත් කුතුහලයක් හා ඕනෑකමක් ඇති වුවාට සැක නැත. එතුමිය තම නිර්මල බව හා පිරිසිදු කම තහවුරු කරමින් දේව දූතයාට පවසනුයේ "මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකිද?" කියාය.

මින් පැහැදිලි වනුයේ මේ වන විට මරිය තුමිය ජුසේ තුමාට විවාහ ගිවිසුම් දී සිටියත් ඔවුන් එකට ජීවත් නොවූ බවය. එනම් නුදුරු අනාගතයේ දිනක ඔවුන්ගේ විවාහය සිදු විය හැකි බවත්‍ය. අනෙක් අතට ගාබ්‍රියෙල් දේව දූතයා ක්‍රිස්තු උපත සම්බන්ධයෙන් නියමිත දින වකවානුවක් පැහැදිලිව ප්‍රකාශ නොකරන නිසා දේව මාතා වහන්සේට මෙවැනි ගැටළුවක් ඇති වීම සාදාරණය.

එවිට දේව දූතයා දෙවියන් වහන්සේ මනුෂ්‍යයා බවට පත්වන ආකාරය පිලිබඳව මරිය තුමියට පැහැදිලි කර දෙයි. "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ අනුහාවයද ඔබ වසා ගන්නේය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක." (ලූක්1/35)

ජේසුස් වහන්සේට සම්පූර්ණයෙන්ම මිනිස් සොබාව ලැබුණේ මරිය තුමිය මඟින් උන්වහන්සේට මිනිස් පියෙක් නැත. උන්වහන්සේගේ ලියා ස්වර්ගීය පියාණන් වහන්සේය. ශුද්ධවර ජුසේ තුමා උන්වහන්සේගේ සුරැකි පියාය. සුරැකි පියා වන ශුද්ධ වූ ජුසේ තුමාද ක්‍රිස්තු අභිරහස තුළ උන්වහන්සේට අනන්‍ය වූ මෙහෙවරක නියැලුණ සේක.

<u>මරිය තුමියගේ ප්‍රතිචාරය</u>

"බලන්න , මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා."(ලූක් 1/38) අනාගත අවිනිශ්චිත භාවය තුළ වුවද මරිය තුමිය දේව දූතයාගේ වචනය මුළුහඳින් හා කයින් පිළිගත්තාය. මුළුමනින්ම දේව කැමැත්තට හිස නැමුවාය. නතු වුවාය. දෙවියන් වහන්සේ කෙරෙහි දිවි හිමියෙන් විශ්වාසය තැබුවාය. උන්වහන්සේව පරිපූර්ණ ලෙස අයිති කර ගත්තාය.

පුරාණ ගිවිසුම ආරම්භ වන්නේ ආබ්‍රහම් තුමාගේ විශ්වාසය ප්‍රකාශ කිරීමෙනි. ආබ්‍රහම් තුමා අපගේ විශ්වාසයේ පියාණෝය. බලාපොරොත්තුවට එහා බලාපොරොත්තුවක් තබා එතුමා විශ්වාසයෙන් යුතුව දෙවියන් වහන්සේට පිළිතුරු දුන්නේය.

නව ගිවිසුම ආරම්භ වන්නේ දේව මාතා වහන්සේගේ විශ්වාසය ප්‍රකාශ කිරීමෙනි. දෙවියන් වහන්සේ තුළ සියල්ල කළ හැකි බව පිළිගනිමින් තමන්ගේ සම්පූර්ණ අයිතිය දෙවියන් වහන්සේ ලබා දෙමින් ඕතුමිය ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ තුළ සකල මිනිස් වර්ගයා සමඟ ඇති කර ගත් නව ගිවිසුමට අවතීර්ණ වීමට විශ්වාසයේ යොමුවක් ලබා දුන්නාය.

සැබවින්ම මරිය මාතාවන් දේව මාතාවන් බවට පත් වනුයේ පුරාණ සර්පයාව විශ්වාස කිරීමෙන් නොව දේව දූතයාව විශ්වාස කිරීමෙනි එතුමිය තම විශ්වාසය ප්‍රකාශ කළ සැණින් වාක්‍යයාණෝ ශුද්ධාත්මානු භාවයෙන් එතුමියගේ කුස තුළ පිළිසිඳ ගත්තාය. මෙතැන් පටන් අපි එතුමියව "දේව මාතාවන්" යනුවෙන් ගරු බුහුමනින් යුතුව ආමන්ත්‍රණය කරමු.

දේව මාතාව :- "දෙවියන් දරන්නී දෙවියන්ට උපත දෙන්නී"

මරිය තුමියගේ දේව මාතෘත්වය පිළිබඳව ක්‍රි.ව. 431 පැවති එපීස මන්ත්‍රණ සභාවේදී පැහැදිලි ලෙස කරුණු ඉදිරිපත් කරනු ලැබීය. මරිය තුමිය ආශිර්වාද ලත් තැනැත්තියක් බවට පත්වුයේ දෙවියන් වහන්සේ විශ්වාස කිරීමෙනි. සුභාරංචියේ සඳහන් එලිසබෙත් තුමියගේ වචන ඊට කදිම සාක්ෂියකි. "සමිදාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේමයයි විශ්වාස කළ තැවැත්ති භාග්‍යවන්තය" (ලූක් 1 /45)

මෙසේ දේව කැමැත්ත විශ්වාසයෙන් බාර ගැනීම තුළ මරිය තුමිය

- දෙවියන් වහන්සේගේ ප්‍රිය දියණියද
- පුත්‍රයාණණ් වහන්සේගේ පෙම්බර මාතාවද
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ වාසස්ථානයද බවට පත්වුවාය.

සැබවින්ම දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වීම ඉතිහාසයේ එක්තරා යුගයක සිදු වූ තවත් එක් සිදුවීමක් පමණක් යැයි අපට අමතක කර දැමිය නොහැකිය. මනුෂ්‍යත්වය දේවත්වය කරා ඔසවනු ලැබූ මෙම අභිරහස තුළින් යුගයෙන් යුගය, කාලයෙන් කාලය අපි දෙව්පියාණන් වහන්සේගේ නොවෙනස් අසීමිත ප්‍රේමය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ පරිපූර්ණව අත්දකිමු.

ඔබ වචනය ලෙස මට සිදුවේවා<br>පවරා දුන්නේ අභිමතයයි<br>කිතු සමිඳුන් ඔබ කුස තුළ ජන්මය<br>මනු සංහතියේ අභිමානයයි.

(මූලාශ්‍රය :- සා. දෙවන ජුවාම් පාවුළු සුදුතුම් පියාගේ ''දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ මාතාවෝ'' විශ්ව ලේඛනය ඇසුරිනි.)

**දිනේෂ් පෙරේරා - දළුගම**

# රත්නපුර පදවියේ රඹුක්කන ශා ඇලෝසියස් දහම් පාසලේ දක්ෂ ලේඛකයෝ

## මනහර ලෝකය



උදෑසනම මල් පිබිදෙනවා
කඳු අතරින් හිරු එබෙනවා
කුරුලන් කැඳලිවලින් පියඹනවා
ලස්සන ලෝකය පිබිදෙනවා

ගංගා ගල්පර අතරින් ගලා බසිනවා
මුහුදේ සැම තැන රැල්ල සැදෙනවා
ගස් වැල් සුළඟින් නැමී තිබෙනවා
දෙවිඳුන් මැව් ලෝකය පිබිදෙනවා

**ඇන්ජලෝ අකුරණ**
07 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන

## ආදරණීය අම්මාට



ලේ කිර කර පොවා සියලු සැප අතහැර
තම දරුවන්ගේ සතුට පමණක් සිතා
මුළු දිවියම කැප කෙරූ මගෙ ආදර අම්මේ
ඔබ දැරූ වෙහෙසට ස්තූති කීමට
අපට වචන නොමැති මුත්
අප ඔබට සදා ණයගැතිය
ඔබගේ ආදරය සෙනෙහස මැද
අප නැළවූ හැටි මට අද මෙන්
මතකයේ ඇත එදා මෙන් අදත්
ඔබ සුරතේ නැළවෙන්නට
වරම් නොමැති වුවත්
අදටත් ඔබට ඇති ආදරය
ලෙංගතුකම එසේමය

**යොහානි ජයමාන්න**
10 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල
රඹුක්කන

## වැඩමුළුවක ප්‍රතිඵලයක්

## වැසිදිනයක සිදුවීමක්.....

මා සතියේ දිනයක පන්ති ඇරී පැමිණෙන විට මහා වර්ෂාවක් පතිත විය. මම බෝක්කුවක් අසලින් යන විට සතෙකු කෙඳිරිගාන හඬක් ඇසුණි. මම බිම බලන විට කිසිවෙකු සිටියේ නැත. මම බෝක්කුව යට බලන විට වර්ෂාවෙන් පිරුණු වතුර ගලා බසින බෝක්කුව තුළ කුඩා බලු පැටවෙකු දුටුවේය. මම බලු පැටියාව බෝක්කුව තුළින් එළියට ගෙන පාරෙන් තිබූ විට ඌ මා දෙස අහිංසක දෑසින් බලා සිටියේය. මට බලුපැටියාව පාරේ දමා යන්නට දුක සිතුනි. මම එක් අතකින් කුඩයද අනික් අතින් බලු පැටවාද රැගෙන ගෙදරට ගියෙමි.

ගෙදර දොරින් ඇතුළු වීමට පෙර මව මට බනීවිදෝ කියා බියක් ඇතිවිනි. මම දොර හිමින් ඇර බලුපැටවාව බිම තියා ගේ ඇතුළට ගියේය. මව කිසියම් වැඩක යෙදී සිටියේ කුස්සියේය. මම දුව ගොස් බලුපැටවා මගේ කාමරය තුළට ගෙනාවාය. මා බලු පැටවා රෙදි කඩකින් පිහදා දැමුවාය. මාගේ මව කාමරයට හදිස්සියෙන් පැමිණියේය. මව බලු පැටවා දුටු ගමන් කෝපයට පත් වුවාය. එහෙත් මාගෙන් බලු පැටවාගෙත් අහිංසක දුක් මුහුණුවල් දැක මවද මට බලුපැටවා බලා ගැනීමට උදව් විය.

**දිනෙත්මි විදස්නා**
09 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන

## ළමා ජීවිතය

ළමා ජීවිතය කටු අත්තක් වැනිය එය ජය ගැනීම සාගරයේ ආරම්භය සොයන්නාක් වැනිය. ළමා දිවිය ජීවිතයේ සුන්දරම අවදියයි. එමෙන්ම භයානකම කාලයයි. ඒ මන්ද මේ කාලයේ දී ඝනඳුර නිම්න රාශියක් පසු කිරීමට ඇත.

**නිම්ෂානි බර්නදෙත්** - 08 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන



**දුල්ෂාන් ඇන්ජලෝ**
07 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල
රඹුක්කන



**රෝමි රුක්ෂාන්**
10 ශ්‍රේණිය
සා. ඇලෝසියස් දහම් පාසල
රඹුක්කන

# දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණෝ......



තෝමස් බෙන්ජමින් කුරේ දරුවා වර්ෂ 1901 දෙසැම්බර් මස 28 වන දා ශ්‍රී ලංකාවේ "පුංචි රෝමය" යනුවෙන් විරුදාවලි ලද මීගමුවේ, පෙරියමුල්ල ගම්මානය උපන් බිම කර ගනිමින් මෙලොව එළිය දුටුවේ පයලත් ආරච්චිගේ ජේකබ් කුරේ හා පයසිංහ ආරච්චිගේ මර්ගරීතා සිල්වා දෙපල දෙමව්පියන් වශයෙන් දෙවිඳුන්ගෙන් උරුම කර ගනිමිනි.

දළුපත රෝමානු කතෝලික පාසලින් ප්‍රාථමික අධ්‍යාපනය ලබා වර්ෂ 1910 ඔක්තෝබර් 15 වනදා ප්‍රථම වරට දිව බොදුන් ලැබූ තෝමස් බෙන්ජමින් දරුවා ආදර්ශවත් දෙමාපිය ආරය, සැලකිල්ල, ආභාෂය ලබමින් ළමා විය ගත කළා. නව යොවුන් වියට පත් තෝමස් දරුවාට ජේසු සමිඳුන්ගේ මිදි උයනේ සේවයට පිවිසීමට අත්වැලක් සැපයුවේ තම "ප්‍රේම අම්මා" බව පසුකලෙක එතුමා සඳහන් කර තිබෙනවා. වර්ෂ 1923 කොළඹ සා. ඇලෝසියස් දෙව්සත්හලට ඇතුළත් වූ තෝමස් කුරේ සිසුවා වර්ෂ 1924 දී කොළඹ බර්නාඩු දෙව්සත්හලට ඇතුළත් උනා. දෙව්සත්හලෙන් සරසවියට ඇතුළත් වුයේ ප්‍රථම සිසුවා ලෙසිනි.

වර්ෂ 1925 දී බම්බලපිටියේ නවක පූජකාරාමයට ඇතුළුව ප්‍රථම පූජක පොරොන්දු දෙන ලැබුවා. මෙතුමා රෝමයේ අධ්‍යාපනය ලබා වර්ෂ 1929 ජුනි 23 දින රෝමයේ දී නි.ම.නි (නිර්මල මරිය නිකායික) පියතුමෙකු ලෙසින් පූජකවරය ලැබුවා. වර්ෂ 1931 දී දිවයිනට සැපත් එතුමා මරදාන සා. ජෝසප් විදුහලේ ගුරු පත්වීමක් ලැබුවා. එතුමාගේ ගුර බුද්ධි මහිමයත්, කැපවීමත් ඇගයීමට ලක්වුණි.

එවකට ලංකාවේ අගරදගුරු ධූරය දැරූ අති උතුම් ජීන් මේරි මසොන් නි.ම.නි. හිමිපාණන්ගේ නිර්දේශය මත අගරදගුරු පදවියේ යුව රදගුරු පදවියට ශුද්ධාසනය විසින් එතුමන් පත් කරනු ලැබුවා. 1947 මාර්තු 07 දින ශ්‍රී ලංකාව දෙවන ලෝක සංග්‍රාමයෙන් බේරා ගැනීම සඳහා අති උතුම් මසොන් නි.ම.නි. හිමිපාණන් තේවත්තේ භාරය වූ තේවත්තේ බැසිලිකා දෙව් විමන ඉදිකිරීම පැවරුණේ මසොන් හිමි ස්වර්ගස්ථ වීමෙන් පසු අගරද ගුරු ධූරයට පත්වූ කුරේ හිමිපාණන්ටයි.

වර්ෂ 1965 පෙබරවාරි 22දා රෝමයේ දී කාදිනල් ධූරයෙන් පිදුම් ලද අති උතුම් තෝමස් බෙන්ජමින් කුරේ හිමිපාණෝ ඉසිඹු ලබා තේවත්තේ "එම්මාවුස් " නිවසේ පදිංචිව සිටියහ. 1988 ඔක්තෝබර් 29 දා මෙයින් වසර 26 කට පෙර ස්වර්ගස්ථ විය.. කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් නිර්මල මරිය නිකායේ සහ ශුද්ධාසනයේ නිසි අවසරය අනුව ශුද්ධවරයට එසැවීමේ කාර්ය භාරයට මුල පුරා තිබෙනවා. දේව සේවක තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමිපාණන් ශුද්ධවරයට ඔසවාලීම සඳහා ආදර දුවේ පුතේ, ඔබත් දෙව් සමිඳුන්ට යදින්න.

**සී.ආර්. ඩික්සන් ඇන්ටනි**
මාධ්‍ය ලේකම් - අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමි අනුස්මරණ කමිටුව


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
72
දෙබස් ..චිත්‍ර..
ඕං මෙන්න වතුර
මේක නම් හරිම පුදුමයක් පර්වතය උඩින් වතුර ගලනවා
ඔක්කොම භාජන වලට වතුර පුරවා ගනිල්ලා..
ඇතිවෙනකම් වතුර බීපල්ලා..
දෙවියන් වහන්සේ මෝසෙස්ට නැවත කතා කර....
මෝසෙස්.. ආරොන් හා ඔහුගේ පුත් එළියාසර්... සමග.. වහාම.. කඳු මුදුනට.... ...එනු...
ආරොන්.. දෙවියන් වහන්සේ කියා සිටින්නේ... නුඹේ පුත් එළියාසර් සමග කන්ද මුදුනට පැමිණෙන ලෙසයි...
හොඳයි.. අපි යමු..
කඳු මුදුනේදී..
ආහ්.. අ.. ආහ්..
..ඔහ් පියාණෙනි..
මට සෑම දේම කළ හැකි බව නුඹලාට සිතා ගන්ට බැරිවුණා.. නුඹලාට මා ගැන විශ්වාසයක් නැති හැඩයි... ..නුඹලාට... පොරොන්දු වූ දේශය දැකගන්ට ලැබෙන්නේ ....නැහැ...
ඔහ්...
මෝසෙසුයි දෙවියන් වහන්සේ.. අපට පොරොන්දු වූ දේශයට යාමට ඉඩ දෙන්නේ නැද්ද...
එහිදී ඔවුන් හෝර් නම් කඳුකර ප්‍රදේශයකට පැමිණියෝය

# ප්‍රහේලිකා අංක 48

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | | ■ | ■ | |
| | ■ | 6 | 7 | | |
| 8 | | ■ | | ■ | |

## හරහට

1. ක්‍රිස්තුන් වහන්සේ තම ඉගැන්වීම් වලට මෙම ගස බොහෝ විට යොදා ගත් සේක.

4. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව උස් තැනකට පමුණුවා , ලෝකයේ සියළු රට රාජ්‍යයන් හා ඒවායේ ..... ඉසුරු ද පෙන්වා, යක්ෂයාට වඳින්නේ නම් ඒවා ලබා දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ....................විශ්වාස කිරීම සෙවනැන්ලක් අල්ලා ගැනීම වැනියැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. එසේනම් යමෙකුට තමා................... මග තේරුම් ගත හැකිදැයි හිතෝපදේශයේ විමසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

## පහළට

1. ''ක්‍රිස්තියානි'' යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදීය.

2. ක්‍රිස්තුන් වහන්සේ පන්දහසකට කෑම ලබා දීමේ සිද්ධියට පෙර මෙම මුහුදෙන් එගොඩට වැඩම කළ බව ශුද්ධවූ ජුවාම් තුමා පවසයි.

3. පව්කාරයා මනස්ථාපනය වී පැමිණෙන තුරු දෙවිපියාණන් වහන්සේ අත් නොහැර බලා සිටින බවත්, එසේ පැමිණි විට සන්තෝෂවන බවත් පෙන්වූ එක් උපමාවකි, නැති වූ ......... පිළිබඳ උපමාව. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. වෙහෙසවන , බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට ...... දෙමි. ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෝසප්ගේ සහෝදරයන් ඔහු සමග ඊර්ෂ්‍යායෙන් ජෝසප්ව මෙවැන්නක හෙලුවේය.

මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4/6, 15/8, ශු මාක් 11/20, ශු. මතෙව් 11/28 , ශු. ජුවාම් 6/1, ක්‍රියා 11/26, උපදේශකය හෙවත් සිරාක් 34/2, හිතෝපදේශය 20/24, උත්පත්ති 37/24

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

# ප්‍රහේලිකා අංක 47

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 අ | න | 2 නි | ය | 3 ස් | ■ |
| න් | ■ | ර | ■ | තෝ | ■ |
| 4 ති | ර | ය | ■ | ප | ■ |
| යෝ | ■ | ■ | 5 ර | න් | ■ |
| කි | ■ | ■ | ජු | ■ | 6 සු |
| 7 ය | ස | ■ | ■ | 8 ප | ව |

## ප්‍රහේලිකා අංක 47 - ජයග්‍රාහකයෝ

- **පළමු වන ස්ථානය**

  තාරිකා මධුභාෂිණී - 11 ශ්‍රේණිය

  ශා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන

- **2 දෙවන ස්ථානය**

  රංගිකා ගිම්හාණි - 04 ශ්‍රේණිය

  ශා. බෲනෝ දහම් පාසල - තඹකන්ද

- **තෙවන ස්ථානය**

  මධුෂාන් සංජීව - 08 ශ්‍රේණිය

  ආරෝග්‍ය මාතා දහම් පාසල - හබරණ

  ඉමේෂා නෙත්මි - 08 ශ්‍රේණිය

  ශා. තෝමස් දහම් පාසල - කෝට්ටේ

# මීගමුව ආවේ මරියා බාලිකාවේ සිඟිතියන්ගේ සංස්කෘතික මංගල්‍යය.





මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ සංස්කෘතික උළෙල පසුගියදා අති උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලැබීය. ගරු මැඩෝනා විමලදාස පැවිදි සොයුරියගේ ප්‍රධානත්වයෙන්, විදුහල්පතිනිය ගරු ශිරානි අල්ගම, ප්‍රාථමික අංශ විදුහල්පතිනි ගරු සුදාරිකා ප්‍රනාන්දු පැවිදි සොහොයුරියන් සහ යහපත් එඬේරා කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය වන ගරු රෝස්මරි පැවිදි සොහොයුරියගේ සහභාගීත්වයෙන්, ළමුන්ගේ විශේෂාංග රැසක් සමඟ පැවති මෙම උත්සවයේදී සංස්කෘතික තරඟ සඳහා සහභාගී වී කුසලතා දැක්වූ සිසුවියන් 277 දෙනෙකු අගයමින් ත්‍යාග හා සහතික පත් පිරිනමනු ලැබීය....

**සටහන හා සේයා - සුගත් පල්ලෙවෙල**

ළමා ප්‍රදීපය



















